Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

## අම්බලන්ගොඩ නගර සභාව

### දකුණු පළාත් රාජ්‍ය සේවයේ තනතුරු පුරප්පාඩු

අම්බලන්ගොඩ නගර සභාවේ දැනට පුරප්පාඩු වී පවත්නා පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ඇති දකුණු පළාත් සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සුදුසුකම් හා බඳවා ගැනීමේ ක්‍රමය* |
|---|---|---|---|---|
| 01. | පැස්සුම්කරු ප්‍රාථමික අර්ධ ශිල්පීය III | 01 | PL 2- 2016<br>රු. 25,250-10x270-10x300-10x330-12x350- රු. 38,450 | අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හය (06) ක් සමත්වී තිබිය යුතු ය.<br>අදළ තනතුරට නියමිත පරිදි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවයන්හි (N.V.Q.) අවම වශයෙන් දෙවැනි මට්ටමේ නිපුණතාවයක් ලබා තිබීම.<br>අදළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද අමතර සුදුසුකමකි. |
| 02. | බර උපකරණ ක්‍රියාකරු ප්‍රාථමික ශිල්පීය III | 01 | PL 3- 2016<br>රු. 25,790-10x270-10x300-10x330-12x350- රු. 38,990 | අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී ඕනෑම විෂයයන් හය (06) ක් සමත්වී තිබිය යුතු ය.<br>අදළ තනතුරට නියමිත පරිදි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවයන්හි (N.V.Q.) අවම වශයෙන් හතරවැනි මට්ටමේ නිපුණතාවයක් ලබා තිබීම අමතර සුදුසුකමකි.<br>පුරප්පාඩුව පවතින මෝටර් රථ වර්ගයෙහි රියැදුරු තනතුරුවල ස්වභාවය මත රථ පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් හා නිපුණතාවය පිළිබඳ සහතිකයක් ලබා සිටිය යුතුය.<br>මෝටර් රථ රියැදුරන් රියැදුරු බලපත්‍රය ලැබීමෙන් පසු අවම වශයෙන් වසර 03ක පළපුරුද්දක් ලබා තිබිය යුතු ය. |
| 03. | මුරකරු III | 01 | PL 1- 2016<br>රු. 24,250-10x250-10x270-10x300-12x330- රු. 36,410 | අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාග යේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හය (06) ක් සමත් වී තිබිය යුතු ය. |
| 04. | වැඩ ක්ෂේත්‍ර කම්කරු III | 04 | PL 1- 2016<br>රු. 24,250-10x250-10x270-10x300-12x330- රු. 36,410 | අටවන ශ්‍රේණිය (09 වසර) සමත්ව තිබීම. |

*බඳවා ගැනීමේ පොදු සුදුසුකම් :-*

1. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
2. යහපත් ශරීරයකින් හා මනා සෞඛ්‍යයකින් යුක්ත විය යුතු ය.
3. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18-45ත් අතර විය යුතු ය. (ස්ථිර තනතුරක සිටින අභ්‍යන්තර අයදුම්කරුවෙකුට උපරිම වයස් සීමාව අදළ නොවේ.)

4. අංක 01, 03 හා 04 තනතුරු සඳහා අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03ක දකුණු පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු ය. අංක 02 තනතුරු සඳහා අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්නයෙන් වූ වසර 05ක අනුගාමී වසර 03ක ස්ථිර පදිංචිය සනාථ කළ යුතුය. පදිංචි වසමේ ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන ලද සහතිකය මත අදාල ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කර නිකුත් කරන ලද ලියවිල්ලකින් පදිංචිය සනාථ කළ යුතු ය.

5. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී හෝ රජයේ හෝ රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූ අයෙකු නොවිය යුතු ය.

*සේවා නියුක්ත කිරීමේ කොන්දේසි :*

1. සේවා අවශ්‍යතාවය මත විධිමත් සම්මුඛ පරීක්ෂණයකින් සුදුස්සන් තෝරා ගනු ලැබේ.
2. තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය සම්බන්ධයෙන් රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට යටත් විය යුතු ය.
3. වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය.
4. පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ.
5. මෙයට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි වලටද, දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝගවලට ද, වරින් වර දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව සේවය කිරීමට බැඳී සිටිය යුතු ය.
6. මෙම ක්ෂේත්‍රයේ පළපුරුද්ද ලබා තිබීම කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

*අයදුම්පත් ඉදිරිපත් කිරීම :*

1. මෙම නිවේදනයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදළ තනතුර සඳහන් කළ යුතු ය.

2. සම්පූර්ණ කරන ලද අයදුම්පත් පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් ද සමගින් 2017 අගෝස්තු මස 31 වැනි දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් ලේකම්, නගර සභාව, අම්බලන්ගොඩ යන ලිපිනයට එවිය යුතු ය.

   *අ.* උප්පැන්න සහතිකය

   *ආ.* අධ්‍යාපන සහතිකය

   *ඇ.* මෑතකදී ලබාගත් චරිත සහතික 02ක්

   *ඈ.* පදිංචිය සනාථ කිරීමට ප්‍රාදේශීය ලේකම් සනාථ කළ ග්‍රාම නිලධාරී සහතිකය

   *ඉ.* වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද තිබේ නම් ඒ බව සනාථ කෙරෙන සහතික

   *ඊ.* සේවා සහතිකය

*සැලකිය යුතුයි. -*

දැනට රාජ්‍ය සේවයේ නියුතු වූවන් තමන්ගේ අයදුම්පත් ආයතන ප්‍රධානියාගේ නිර්දේශය මත එවිය යුතුය. අයදුම්පත් සමග එවන සහතිකවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.

ඉදුමිණි ඩී. ලියනගේ,
ලේකම්,
අම්බලන්ගොඩ නගර සභාව.

2017 ක් වූ ජුනි මස 30 වැනි දින,
අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේ දී ය.

යොමු අංකය ඃ
(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

**ආදර්ශ අයදුම්පත්‍රය**

අම්බලන්ගොඩ නගර සභාව

***....................... තනතුර සඳහා අයදුම්පත්‍රය***

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————————————————.
2. මුලකුරු සමග නම :————————————————.
3. ස්ථිර ලිපිනය :————————————————.
4. උපන් දිනය ඃ වර්ෂය :—————— මාසය:—————— දිනය:——————
5. අයදුම්පත් භාර ගන්නා 2017.08.31 දිනට වයස :——————
6. ජාතිය :————————————————.
7. ආගම :————————————————.
8. විවාහක/අවිවාහක බව :————————————————.
9. ස්ත්‍රී/පුරුෂභාවය :————————————————.
10. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද ? එසේ නම් ඒ පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද යන වග :————————————————
11. නගර සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචි කාලය :————————————————.
12. අධ්‍යාපන සුදුසුකම් :

1. අ.පො.ස. (සාමාන්‍ය පෙළ) ඃ

| *විෂයයන්* | *සාමාර්ථ* | *විෂයයන්* | *සාමාර්ථ* |
|---|---|---|---|
| 1. | | 5. | |
| 2. | | 6. | |
| 3. | | 7. | |
| 4. | | 8. | |

13. ඔබ ලබා ඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම් :————————————————.
14. වෙනත් සුදුසුකම් :————————————————.
15. සේවා පළපුරුද්ද :————————————————.
16. ඔබ කවරදක හෝ චෝදනාවක් ලැබ උසාවියකින් වරදකරුවකු වී තිබේ ද ? :————————————————.

ඉහත සඳහන් කරන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. සාවද්‍ය තොරතුරු සපයා තිබුනහොත් සම්මුඛ පරීක්ෂණයට පෙර හෝ පසුව අපේක්ෂකත්වය අවලංගු වන බවත්, තෝරා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දන්වමි.

————————.
අයදුම්කරුගේ අත්සන.

*රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන් සඳහා*

ඉහත නම් සඳහන් .................................. මයා./මිය. දැනට මෙම ආයතනයේ .................................. වශයෙන් සේවය කරයි.

ඔහු/ඇය මෙම තනතුරට තෝරා ගතහොත් සේවයෙන් නිදහස් කළ හැකි ය. /නොහැකි ය. ඔහු/ඇය විනයානුකූල දඬුවමකට ලක්වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

————————.
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :————————————
පදවි නාමය :————————————
දෙපාර්තමේන්තුව/ආයතනය :————————————
(නිල මුද්‍රාව තබන්න)
දිනය :————————————